ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය
இலங்கையின் பிரதம மந்திரி
Prime Minister of Sri Lanka

# නිදහස යනු දිනාගෙන අවසාන වන්නක් නොවේ

හැත්තෑ හතරවෙනි නිදහස් දිනය අපට සැමරීමට සිදුව තිබෙන්නේ දැවැන්ත අභියෝගයන් රාශියක් මධ්‍යයේය. දෙවසරක් පුරා ලෝකයටම බලපෑම් කළ කොරෝනා වසංගතය අප හමුවට ගෙනැවිත් ඇති අභියෝගය සුළු පටු නොවේ.

එදා විදේශ ආක්‍රමණ සේම බෙදුම්වාදී ත්‍රස්තවාදය නිසා අපේ රටේ ජනතාවගේ නිදහස අහිමි වූ අතර අද නිදහස අහිමි වී පීඩා වැඩි වී ඇත්තේ කොරෝනා වසංගතය නිසාය. කොරෝනා වසංගතය රට නැංවීමට තිබූ අගනා වසර දෙකක් අපට අහිමි කළේය. අධ්‍යාපනය, ආර්ථිකය සහ ජන ජීවිතය උඩු යටිකුරු කළේය. එහෙත් ඒ ගැන කම්පා වීම නිදහස දිනා ගැනීමට කැප වූ ජාතියකට තරම් නොවේ. ඒ ගැන තැවෙමින් හිඳීම නිදහස සඳහා සටන් කර පුරුදු ජාතියකට ඔබින්නේද නැත. ලොවම දැවැන්ත අසීරුකම්වලට මුහුණ දුන්නද එයින් ගැලවීම සඳහා ගෝලීයව යොදාගත් සැම සාධනීය ක්‍රියා මාර්ගයක්ම අප ද අනුගමනය කළෙමු. කොරෝනා රෝගයට විසඳුම වූ එන්නත්කරණ අවස්ථා තුනම දැනටමත් ජනතාව වෙත ලබා දී ඇත්තෙමු. කොරෝනා වසංගතයෙන් නිදහස් වෙමින් ජන ජීවිතය සාමාන්‍යකරණයට යළි පිවිසෙමින් සිටින්නේ අප අනුගමනය කළ මේ ක්‍රියාමාර්ගය නිසාය.

නිදහස යනු දිනාගෙන අවසන් වන්නක් නොවේ. එය දිනෙන් දින දිනාගත යුත්තකි. සැම නිදහස් දිනයකම අප අවධාරණය කළ යුතු කාරණය එයයි. කෙසේ වෙතත් නිදහස සඳහා වසර සිය ගණනක් අඛණ්ඩව අරගලයක යෙදී ඒවායින් පන්නරය ලද ජාතියකට මෙම අභියෝගයද භාරගෙන ඒ හමුවේ නොවැටී සිටිය හැකි බව මාගේ විශ්වාසයයි. නිදහස සඳහා අප්‍රමාණව සටන් කර පුරුදු ජාතියක් වශයෙන් මේ අභියෝග හමුවේ නැගී සිටීමට මේ නිදහස් දිනයේ අදිටන් කර ගනිමු.

**මහින්ද රාජපක්ෂ**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අග්‍රාමාත්‍ය